**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ව සංවර්ධන උපදේශක තනතුරට බඳවා ගැනීමේ (විවෘත) විභාගය 2019</u>**

උක්ත තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් යොමු කරන ලද අයදුම්පත්‍රය අනුව 2019.01.26 දින පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය 2023.12.13 දින පෙ.ව.9.30 ට අංක 628,10 වන මහල,ජනජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය යන ලිපිනයේ පිහිටි බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. එදිනට පහත සඳහන් සහතික වල මුල් පිටපත් සහ ඒවායේ ඡායාපිටපත් (සත්‍ය පිටපත් බවට ඔබ විසින් සහතික කරන ලදුව)රැගෙන මෙම කාර්යාලයට පැමිණෙන ලෙස මෙයින් දන්වමි.

I. උප්පැන්න සහතිකය (ඔබ භාවිතා කරන නමෙහි සහ උපැපැන්න සහතිකයේ සඳහන් නමෙහි කිසියම් වෙනසක් ඇත්නම් එම වෙනස පැහැදිලි කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක්ද ඉදිරිපත් කළ යුතුය.)

II. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය

III. අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) සහතික (උප්පැන්න සහතිකයේ නම හා සහතිකවල නමෙහි කිසියම් වෙනසක් ඇත්නම් එම වෙනස පැහැදිලි කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය.)

IV. නිවේදනයේ සඳහන් පරිදි තනතුරට අදාළව ඔබ විසින් ලබාගෙන ඇති අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වල සහතික (උපාධි සහතිකය ඇත්නම් උපාධි සහතිකයද උපාධිය සම්පූර්ණ කර නොමැති නම් දැනට සම්පූර්ණ කර ඇති වසර වල සහතික කරන ලද ප්‍රතිඵල ලේඛණ)

V. අයදුම්පත් කැඳවන අවසාන දිනට (2019.07.24) පූර්වාසන්න වසර තුනක් (3) තුළ බස්නාහිර පළාතේ අඛණ්ඩ ස්ථිර පදිංචිය තිබූ බව සනාථ කිරීම සඳහා ඔබ පදිංචි කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් පදිංචි සහතිකය (ඩී.එස්.04 ආකෘතිය)

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.